# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 72 — 1973 අගෝස්තු 10 වැනි සිකුරාදා — 1973.08.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු .. .. .. | 997 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 1016 |


## තනතුරු — ඇබෑර්තු

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළ වන පොදු කොන්දේසි**

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම් කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්, රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත් වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන්ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

**2. දීමනා**

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනා වක් ගෙවනු ඇත.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. ඩී. සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය නැත මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි : සාමාන්‍ය**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකූත් කොන්දේසිවලට ද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකි වූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්‍ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී නව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්‍ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්‍ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත් වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේ ය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9%ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ත් දක්වා වූ සෙච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්වද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම කැමැත්තෙන් එම සේවාවන්ගෙන් අස් වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතු නම්ද ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස් වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයක් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

**7 : 1** රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුව හොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

**7 : 2** නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

**7 : 3** යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරාගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එසිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

**7 : 4** අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම්කිසි සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

**7 : 5** මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

**8 : 1** සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

අංකය : 2/1/45.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම නිලධාරි තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම නිලධාරි තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර හෝ ලේකම්, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය, 315, වොක්ෂෝල් වීදිය, තැ. පෙ. 569, කොළඹ 2 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත් : 1973 අගෝස්තු මස 31 වැනිද

(බී) පිටරට ඉල්ලුම් පත් : 1973 අගෝස්තු මස 31 වැනිද

**සංලක්ෂ්‍යය :**

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය නො හැකිය. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩු අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම්පත් ශ්‍රී ලංකාවේ, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි රටට හෝ ඊට ආසන්න තම රටට හෝ පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට කැමති නම් ඔවුන්ට එසේ කළ හැකිය.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා යානපත්‍ර.**—ශ්‍රී ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු විසින් පැවැත්වෙන පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණ සඳහා ගාස්තුවත් එසේම ලංකාවට පැමිණීම සඳහා වැය වන යානපත්‍ර, වියදමත් එම නිලධාරීන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—තනතුර ස්ථිරය. රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3ක පරීක්ෂණ කාලයක් මතය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය අවුරුද්දකට රුපියල් 6,720න් පටන් ගෙන රුපියල් 360 වාර්ෂික වැඩිවීම් 12කින් හා රුපියල් 480 වාර්ෂික වැඩිවීම් 11 කින්ද යුක්තව රුපියල් 16,320 දක්වා වැඩිවී යයි. (රුපියල් 8,880 සහ 11,520 සහ රුපියල් 14,880 යන වැටුප් තලයන්ට පෙර ක්‍රියාත්මක වන කාර්යක්ෂමතා කඩයිම් ඇත.)

සටහන.—වර්ෂයකට රුපියල් 11,520 ට පෙර ඇති කාර්යක්ෂමතා කඩයිමෙන් උසස් කරනු ලැබීමට සුදුසුවීම සඳහා සියලුම නිලධාරීන් නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත්විය යුතුයි.

සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව ;

(ආ) 1973. 08. 31 වැනි දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි බව ;

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ 1 වන හෝ 2 වන පෙළ ගෞරව උපාධිධරයෙකු බව.

5. පහත සඳහන් ලියකියවිලි වලින් කිසිවක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කරන ලෙස නියම කළ විටෙක ඒවා අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ.යු.—උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කර ඇති බවුතීස්ම උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යයන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයා ගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

**සංලක්ෂ්‍යය :**

(i) ඉල්ලුම් පත්‍රයට ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කළ නොහැකිවන අපෙක්ෂකයන්ගේ ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එනෙකුදු වුවත්, එම නිලධාරීන් විසින් තම ඉල්ලුම් පත් යැව්වේ කවදාද යන්න ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත කෙලින්ම ලියා දැන්විය යුතුය.

7. ඉල්ලුම් පත්‍ර සහ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි යැවිය යුත්තේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙතය. ඒවා මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොඑවිය යුතුය,

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නාවූද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර මෙම කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති දෙකක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම මාවෙත දැනුම් දිය යුතුය.

ඒ. පී. එම්. සිල්වා,
ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

1973 ජූනි මස 27 වැනි දින,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය,
315, වොක්ෂෝල් වීදිය,
තැ.පෙ. 569, කොළඹ 2.

### ආදර්ශ අයදුම් පත්‍රය

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය)

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—කෘෂිකර්ම නිලධාරි තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය.)

3. (අ) උපන් දිනය :—
වර්ෂය :————, මාසය :————, දිනය :————.
(ආ) දේශීය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—
වර්ෂය :————, මාසය :————, දින :————.

4. ඔබ ශ්‍රී ලංකා රටවැසියෙක්ද? පාරම්පරික රටවැසියෙක්ද? එසේ නැතහොත් ලියාපදිංචිවූ රටවැසියෙක්ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචිවූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න.) :————.

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරුගේ :————.
(ආ) පියා ගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.
(ඉල්ලුම්කරු උපන්නේ ශ්‍රී ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුය. ඔහු/ඇ උපන්නේ ශ්‍රී ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද, වැන්දඹුවක්ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
(i) සිංහල :————.
(ii) දෙමළ :————.
(iii) ඉංග්‍රීසි :————.

8. වයස අවු. 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |

9. ක්‍රීඩා පිළිබඳ ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිව යුතු පදවි පිළිබඳ විස්තර :————.

10. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණද?————.

11. ඔබ යම්කිසි සාපරාධි වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරුවී ඇත් නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.
(ලබාගන්නා ලද සියළුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය, සුදුසුකම්වල විස්තර, ඒවායේ දිනය, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.)

13. දැනට නිරත රක්ෂාව හා ඊට පූර්වමයෙන් කරන ලද රක්ෂාවල්
(රක්ෂාවට බැඳුන දිනය ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

සැලකිය යුතුයි :—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහල 15 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. **විශේෂ සුදුසුකම්.**—දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතොත් දිනයක්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. (විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න.)

15. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

මෙම අයදුම් පතෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

8-366—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

### සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

**පොල්ගොල්ලේ සමුපකාර අභ්‍යාස විද්‍යාලයේ පුස්තකාලයාධිපති තනතුර**

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොල්ගොල්ල සමුපකාර අභ්‍යාස විද්‍යාලයයෙහි පුස්තකාලයාධිපති තනතුරක් සඳහා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

**අයදුම්පත්‍ර.**—මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගනු ලබන අයදුම්පත් 1973 අගෝස්තු මස 25 දිනට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 419 සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ලැබෙන සේ ලියාපදිංචි කල තැපෑලෙන් එවිය යුතුයි. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය" යන්න ලියුම් කවරයේ වම් පැත්තේ ඉහල කෙළවරේ පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

**සටහන් :**

**(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒහා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභය අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතුය.**

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. පත්වීම් අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා වැටුපෙන් සියයට 6 ක මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. රජයේ දායක මුදල් ඒකාබද්ධ වැටුපෙන් සියයට 9 ක් වනු ඇත. නමුත් රජයේ සේවයෙහි දැනටමත් නියුක්ත ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ අපේක්ෂකයින්ට තවදුරටත් එම විශ්‍රාම වැටුප් හිමිකම් ලැබෙනු ඇත.

(ii) (අ) තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් පත් කරනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත්වය. දැනට රජයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරි යෙකු තෝරා ගනු ලැබුවහොත් නියමිත කාලසීමාවකට වැඩ බැලීමකට පත්කරනු ඇත.

(ආ) තෝරා ගනු ලබන රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් පත් කරනු ලබන්නේ පළමුවෙන් එක් අවුරුදු කාල සීමාවකට වැඩ බැලීමේ පදනමක් මතය. එම කාලය අවසානයේ දී නිලධාරියා සුදුස්සෙක් බව පෙනී ගියහොත් ඔහු/ඇය තනතුරේ ස්ථිර කරනු ඇත. වැඩ බලන කාලය තුළදී ඔහු/ඇය මෙම තනතුර සඳහා නුසුදුසු බව පෙනී ගියහොත් කලින් සිටි තනතුරට ආපසු යවනු ලැබේ.

3. **වැටුප් හා දීමනා.**—මේ තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය.—රුපියල් 6,600 න් පටන් ගෙන රු. 180 වේ වැඩිවීම් 8 කින් සහ රුපියල් 240 හේ වැඩිවීම් 6 කින් රුපියල් 9,480 දක්වා වැඩිවේ. රු. 7,500 ට පෙරද රු. 8,280 ට පෙරද කාර්යක්ෂමතා කඩඉම් ඇත. (1969.10.01 දිනට පෙර පැවති වාර්ෂික අනුරූප මූලික වැටුප් ක්‍රමය රුපියල් 3,900—180×8—240×6—රු. 6,780 වේ).

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයක් හා මනා ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 25 ට නොඅඩු බව හා අවුරුදු 35 ට නොවැඩි බව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත)

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයයක අර්ථ ශාස්ත්‍රය හෝ වාණිජ විද්‍යාව හෝ පිළිබඳ උපාධියක් එසේ නැතහොත්, අර්ථ ශාස්ත්‍රය හෝ වාණිජ විද්‍යාව එක විෂයයක් සහිතව කලා පිළිබඳ උපාධියක් තිබීම.

**සංලක්ෂය.**—පුස්තකාල වැඩ, එහි කළමනාකාරිත්වය හා පාලනය පිළිබඳ පළපුරුද්ද, ඉංග්‍රීසි සිංහල හා දෙමළ හැර වෙනත් භාෂාවල දැනීමක්ද ඇතිවීම අතිරේක සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අවශ්‍ය රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා හැර වෙනත් භාෂාවල දැනීම පිළිබඳ සහතික.

**සැ. යු. :**

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නොවේ.

(ii) ඉල්ලා සිටි අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත හැර කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. ඉල්ලුම්පත්‍ර මෙම කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම මා වෙත දැනුම් දිය යුතුය.

රා. බ. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්.

1973 ජූලි මස 26 දින,
කොළඹ 1, ආදිපාද වීදියේ
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේදීය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය)

**පොල්ගොල්ලේ සමුපකාර අභ්‍යාස විද්‍යාලයේ පුස්තකාලයාධිපති තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම්දිය යුතුය) :————.

3. (අ) උපන්දිනය :—
(වර්ෂය :——, මාසය :——, දිනය :——.
(ආ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—
වර්ෂ :——, මාස :——, දින :——.

4. ජාතිය :————.

5. ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද යන බව :————.

6. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
(i) සිංහල :————.
(ii) දෙමළ :————.
(iii) ඉංග්‍රීසි :————.
(iv) වෙනත් භාෂා :————.

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ/හෝ විශේෂ සුදුසුකම් : ————.

9. පුස්තකාලයාධිපති තනතුරක පළපුරුද්දක් තිබේනම් ඒ පිළිබඳ විස්තර :————.

10. යම්කිසි සාවරාධී වරදකට කෙටිනක හෝ උසාවියකදී ඔබ වරද කරුවී ඇත්නම් ඒම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

11. චරිත සහතික දී ඇති පුද්ගලයන් දෙදෙනාගේ නම් සහ පදවි නාම :————.

මෙම අයදුම්පතෙහි ම විසින් සඳයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගත හොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේව යෙන් පහකිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු/ඇය පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

8-403 —73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පුරප්පාඩු

මණ්ඩලීය සේවාවේ III වෙනි ශ්‍රේණියේ සංඛ්‍යා ලේඛණ නිලධාරි තනතුර සඳහා සලකා බැලීම පිණිස ශ්‍රී ලංකාවේ **පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.**

1. **වැටුප් ක්‍රමය.**—මසකට (සියළු දීමනාවන් ඇතුළුව) රු. 1,100—50×12—රු. 1,700—රු. 1,350 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

2. **වයස.—අවුරුදු 27-35 අතරවීම.**

3. **සුදුසුකම්.**—සංඛ්‍යා ලේඛණය ප්‍රධාන විෂයයක් ලෙස හෝ සංඛ්‍යා ලේඛණය අතිරේක විෂයයක් ලෙසද ආර්ථික විද්‍යාව ප්‍රධාන විෂයයක් වශයෙන්ද ලබාගත් I වෙනි හෝ II වෙනි පෙල ගෞරව උපාධිය සහ අර්ථ ශාස්ත්‍රඥයෙකු හෝ සංඛ්‍යා ලේඛණ නිලධාරියෙකු ලෙස පුද්ගලික ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක අඩුම වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් ලබා තිබීම.

4. ((අ) රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවෙහි සිටින නිළධාරීන් ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ ඒ ඒ දෙපාර්තමේන්තු මගිනි. එම ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලබන්නේ එම දෙපාර්තමේන්තුවල ප්‍රධානියන් 1957 තේ 48 අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවය කිරීමට එම නිලධාරීන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි.

(ආ) සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද, දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජනය කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා ඔවුන් (පත් කිරීමට) තෝරුනොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

5. **සේවා කොන්දේසි.**—තෝරාගනු ලබන අපේක්ෂකයින් 1 වෙනි වතාවට තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත්කරනු ලැබේ. ඔවුන් පහත සඳහන් වන කොන්දේසි වලට යටත් විය යුතුයි :—

(1) **පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන්** වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

(2) දැනටමත් පණවා ඇත්තාවූද, කලින් කල පණවනු ලබන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුයි.

(3) **ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයේ** සිංහල ප්‍රවීණත්වයක් ලබාගත යුතුයි.

(4) **මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 6 ක දායක මුදල් ගෙවිය යුතුයි. මණ්ඩලීය දායක මුදල සියයට 9 කි.**

(5) ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි **කොට්ඨාශයෙහිත් සේවය කිරීමට කැමති විය යුතුයි.**

6. පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1973 අගෝස්තු මස 25 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවක මණ්ඩල කළමනාකාර තැන.

කොළඹ 5, කිරුල පාරේ,
අංක 200 වෙනි ස්ථානයේ දී ය.

### ලංකා ගමනාගමන මණ්ඩලය

### ඉල්ලුම් පත්‍ර පෝර්මය

1. ඉල්ලන තනතුර :————.
2. ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නම :————.
3. ලියුම් ලැබෙන පිළිවෙල :————.
4. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් අමුණන්න.)
5. 1973. 08. 25 දිනට වයස :—
අවුරුදු :— මාස :— දවස් :—
6. ලාංකිකයෙකු වූයේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග :————.
7. විවාහකද, අවිවාහකද යන බව :————.
(විවාහක නම් විවාහවූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න.)
8. ද්විතීය පාඨශාලා අධ්‍යායනය :————.
(ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත් වූ විභාගයද දිනයත් සහිතව සඳහන් කරන්න.)
9. උසස් අධ්‍යායනය.————. (ඔබ ඉගෙනීම ලැබූ විද්‍යායතන, සාමාර්ථය ලත් විභාග, වෘත්තීය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයත් සහිතව සඳහන් කරන්න.)
(සහතික පත්‍රවල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න.)
10. වෛධික සුදුසුකම්.————.(ඔබ ඉගෙනීම ලැබූ ආයතන, සමත්වූ විභාග, ලබා ඇති සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.)
(සහතික පත්‍රවල මුල් පිටපත් නොව අනු පිටපත් අමුණන්න.)
11. පාසැලෙන් අස්වූදා සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. එනම්, ඇරු පදවියේ හා සේවා යෝජකයාගේ නම, පත්වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස්කළ දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු :————.
12. වෘත්තීය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන්කිසි ආයතනයක විධායක තනතුරක වැඩ කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර : (ඇරු තනතුරු, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළුවූ පඩි යන මේවා දිනයන් සහිතව සඳහන් කරන්න.)
————.
13. මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් :————.
(මේ තනතුරට ඔබේ සුදුසුකම් වැඩි කරවන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂෙප විස්තරයක් ලියන්න.)
14. සිංහල භාෂාව ඉගෙනගත් ඉහළම ප්‍රමාණය :————.
15. මීට කලින් ඔබ ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද? එසේ නම් එහි ප්‍රතිඵලය කුමක්ද? :————.
16. සෙසු විස්තර :————.
17. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරුවෙකු වූයේදැයි සඳහන් කරන්න. වරදකරුවෙකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.
18. ඔබ ගැන තොරතුරු දැන ගැනීමට සුදුසු තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න :—
(1) :————.
(2) :————.

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තේරීමට කලින් දැන ගතහොත් මා නුසුදුස්සෙකු විය හැකි නියාව හා තෝරාගැනීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8-463 —73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

### මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ බටහිර, උඩුවක, මතුගොඩේ, දෙනියාය කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ බටහිර, උඩුවක, මතුගොඩේ, දෙනියාය හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා විහාරහේන, දෙනියාය හා කිරිවැල්දොල ග්‍රාම සේවක කොටසේ බටේයාය, කන්දිල්පාන ගම් හා කැම්ඩන්හිල් වත්ත, විලී ගෘප් වතු යායේ කොටසක්, බෙවර්ලි වත්ත, නානගල වත්ත, බෙලිගල්ලෙන වත්ත හා ගලහන්කන්ද වත්ත යන කොට්ඨාශවල ස්ථිර පදිංචිය ඇත්තාවූ පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනය කරමි. මේ සඳහා මෙම කාර්යාලයෙන් හෝ කොටපල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාලයෙන් හෝ නිකුත් කරනු ලබන අයදුම්පත්වල ඉල්ලා ඇති විස්තර නිසි අයුරු සම්පූර්ණකර අදාල සහතිකවල පිටපත් ද සමග 1973 අගෝස්තු මස 30 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචිකළ තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

1. **ලිපිනය.**—දිසාපති, දිසාපති කාර්යාලය, මාතර.

2. **සුදුසුකම්.**—

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 60 ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(ඇ) අයදුම්කරු ඉහත කී කොට්ඨාශයෙහි ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(ඈ) 1925 හා 1944 අතරතුර කාලයෙහි පාඨශාලා හැර යාමේ සහතිකපත්‍ර විභාගයෙන් හෝ සිංහල භාෂාව සහිතව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්

**නැතහොත්**

සිංහල භාෂාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත්වීම.

(ඉ) රජයේ, සංස්ථා හෝ පලාත් පාලන ආයතනවල සේවකයින් නොවිය යුතුය.

(ඊ) පලාත් පාලන ආයතනවල නියෝජිතයන් නොවිය යුතුය.

3. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති අධ්‍යාපන සුසුදුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක් (මින් එකක් පලාතේ ග්‍රාමසේවකගෙන් විය යුතුය.)

(ඈ) කොට්ඨාශයේ ස්ථිර පදිංචිය පිළිබඳ ග්‍රාම සේවකගේ සහතිකය (මෙය කොටපොල, ප්‍රාදේශීය ආදායම් නිලධාරි මගින් ග්‍රාම සේවකට එවිය හැකිය.)

4. මීට අමතරව තම අයදුම්පත සමග එම අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය බවටත්, තමා ණය ගැති නොවන බවටත්, දිවුරුම් සහතිකයක් එවිය යුතුය.

5. සෑම අයදුම්කරුවෙක් ම ඔහුගේ අත් අකුරින් ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

6. අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට සිදුවිය හැක. ඒ සඳහා ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීමක් හෝ කරනු නොලැබේ.

ඩබ්. ඒ. එල්. විජයපාල,
මාතර දිසාපති.

1973 ජූලි මස 26 වැනි දින,
මාතර, දිසාපති කාර්යාලයේ දී ය.

8-417/1—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ උතුර, විල්පිට කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ උතුර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා තිබ්බොටුවාව, ඉහල අතුරලිය, පහල අතුරලිය, විල්පිට බටහිර හා විල්පිට නැගෙනහිර (කොටසක්) යන ග්‍රාම සේවක කොට්ඨාශවල ස්ථිර පදිංචිය ඇත්තාවූ පහත සඳහන් සුදුසුකම් ඇත්තාවූ අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඇරාධනය කරමි. මේ සඳහා මෙම කාර්යාලයෙන් හෝ අකුරැස්ස ප්‍රාදේශීය උප දිසාපති කාර්යාලයෙන් හෝ නිකුත් කරනු ලබන අයදුම්පත්වල ඉල්ලා ඇති විස්තර නිසි අයුරු සම්පූර්ණකර අදාල සහතිකවල **පිටපත්** ද සමග 1973 අගෝස්තු මස 30 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචිකළ තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ :—

1. **ලිපිනය.**—දිසාපති, දිසාපති කාර්යාලය, මාතර.

2. **සුදුසුකම්.**—

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 60 ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුයි.

(ඇ) අයදුම්කරු ඉහත කී කොට්ඨාශයෙහි ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(ඈ) 1925 හා 1944 අතරතුර කාලයෙහි පාඨශාලා හැරයාමේ සහතිකපත්‍ර විභාගයෙන් හෝ සිංහල භාෂාව සහිතව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්

**නැතහොත්**

සිංහල භාෂාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත්වීම.

(ඉ) රජයේ, සංස්ථා හෝ පලාත් පාලන ආයතනයක සේවකයින් නොවිය යුතුය.

(ඊ) පලාත් පාලන ආයතනවල නියෝජිතයින් නොවිය යුතුය.

3. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල **පිටපත්** අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති අධ්‍යාපන සුසුදුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක් (මින් එකක් පලාතේ ග්‍රාම සේවකගෙන් විය යුතුය.)

(ඈ) කොට්ඨාශයේ ස්ථිර පදිංචිය පිළිබඳ ග්‍රාම සේවකගේ සහතිකය (මෙය අකුරැස්සේ, ප්‍රාදේශීය උප දිසාපති මගින් ග්‍රාම සේවකට එවිය හැකිය)

4. මීට අමතරව තම අයදුම්පත සමග එම අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය බවටත්, තමා ණයගැති නොවන බවටත් දිවුරුම් සහතිකයක් එවිය යුතුය.

5. සෑම අයදුම්කරුවෙක් ම ඔහුගේ අත් අකුරින් ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

6. අයදුම්කරුවනට සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට සිදුවිය හැක. ඒ සඳහා ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීමක් හෝ කරනු නොලැබේ.

ඩබ්. ඒ. එල්. විජයපාල,
මාතර දිසාපති.

1973 ජූලි මස 25 වැනි දින,
මාතර, දිසාපති කාර්යාලයේ දී ය.

8-417/2—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**අධිකරණ සේවා උපදේශක මණ්ඩලය**

කාදි තනතුරු

1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතින් සංශෝධිත මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය) යටතේ පහත දැක්වෙන ප්‍රදේශවල කාදි තනතුරු සඳහා අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ :—

(1) මිගමුවේ අධිකරණ කොට්ඨාශය.
(2) බදුල්ලේ පරිපාලන දිස්ත්‍රික්කය.

2. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 35 ට නොඅඩු හොඳ චරිතයකින් සහ තත්වයකින් යුතු ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන පිරිමි පක්ෂයේ මුස්ලිම් අය විය යුතුය.

3. පත් කිරීම සම්බන්ධයෙන් වූ නිවේදනයේ නියම කරනු ලබන කාලසීමාවකට අමාත්‍ය මණ්ඩලය විසින් තෝරා ගනු ලැබූ අපේක්ෂකයින් පත් කරනු ලැබේ.

4. කාදිවරයෙකු වශයෙන් පත්වීම ලබන්නෙක් තමා පත්කර ඇති ප්‍රදේශයේ පදිංචිවීමට නීතියෙන් බැඳී සිටී.

5. මා වෙතින් ලබා ගත හැකි විශේෂ ආකෘති පත්‍රවල මෙම අයදුම්පත් සකස් කළ යුතු අතර ඒවා 1973 සැප්තැම්බර් 10 වැනි දින හෝ ඊට පෙර හෝ මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුය.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ
ලේකම්.

1973 ජූලි මස 30 වැනි දින,
අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 5.

8-456—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

16. රජයේ සේවයෙහි නිරත නිලධාරීන්ගේ ඉල්ලුම් පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. නිලධාරියා තෝරාගනු ලැබුවහොත් ඔහු සේවයෙන් මුදා හැරීමට තමා සූදානම් දැයි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එසේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේදී දන්වා එවිය යුතුය.

17. **තෝරා ගැනීම්, සම්මුඛ පරීක්ෂණ ආදිය.**—සුදුසු යයි සැලෙකන අපේක්ෂකයා, තෝරා ගැනීම් මණ්ඩල ඉදිරියට කැඳවනු ලැබේ. ඒ සඳහා යන වියදම් අපේක්ෂකයා විසින්ම දරාගත යුතුය.

18. මූලික තෝරා ගැනීම් මණ්ඩල විසින් සුදුසුයයි සැලකෙන අපේක්ෂකයන් ගුවන් හමුදාව මගින් වෛද්‍ය පරීක්ෂණයකට භාජන කරනු ලැබේ. අවසාන තෝරා ගැනීම් මණ්ඩලය ඉදිරියෙහි පෙනී සිටීමට පෙරාතුව නිලධාරි යෝග්‍යතා පරීක්ෂණවලටද පෙනී සිටින ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

පී. එච්. මෙන්ඩිස්,
ගුවන් කොමදෝරු,
ගුවන් හමුදා ආඥපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ,
1973 අගෝස්තු 10 වැනි දින.

"අ" පරිශිෂ්ටය

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් පිටි ඉදිකිරීම් ශාඛාවේ (වැඩ සේවා) අධිකාර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. වාසගම :————.
   වෙනත් නම් :————.
   (පැහැදිලි අකුරෙන් ලියන්න)
2. දැනට පදිංචි ස්ථානයෙහි ලිපිනය :—
   (i) දුරකථන අංකය :————.
   (ii) ළඟම ඇති දුම්රිය ස්ථානය :————.
   (iii) ළඟම ඇති පොලිස් ස්ථානය :————.
   (iv) විදුලි පණිවිඩ කාර්යාලය :————.
3. ස්ථිර පදිංචිය :————.
   ඔබ මෙම ස්ථානයෙහි කොපමණ කලක සිට පදිංචිව සිටින්නෙහිද ? :————.
4. විවාහක අවිවාහක බව :————.
5. දෙමව්පියන් පිළිබඳ තොරතුරු :—
   (අ) පියාගේ නම :————.
   උපන් ස්ථානය :————.
   උත්පත්තියෙහිදී රටවැසි බව :————.
   (ආ) මවගේ නම :————.
   උපන් ස්ථානය :————.
   උත්පත්තියෙහිදී රටවැසි බව :————.
6. ඉගෙනීම ලැබූ පාසැල් හා විශ්ව විද්‍යාල පිළිබඳ තොරතුරු :—
   (අ) පාසැල් ආදියෙහි නම් :————.
   (ආ) ඇතුළත් වූ දිනය :————.
   (ඇ) අස් වූ දිනය :————.
7. පාසැලෙන් අස් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :—
   (මෙය සම්පූර්ණ වාර්තාවක් විය යුතුය)
   (අ) සේව්‍යයාගේ නම :————
   (ආ) රැකියාවෙහි ස්වභාවය :————.
   (ඇ) රැකියාව කළ කාලපරිච්ඡේදය :————.
8. ඔබ මින් පෙර කිසියම් හමුදා සේවාවක කිසියම් ඇබෑර්තුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට සහභාගි වී තිබේද ? සහභාගි වී තිබේ නම් ඉල්ලුම් කළ තනතුරු පිළිබඳ විස්තර හා ඒ ඒ දිනයන් සඳහන් කරන්න :————.
9. සිවිල් උසාවියක් නැතහොත් හමුදා උසාවියක් මගින් ඔබ වරදකරුවකු බවට තීරණය වී තිබේද ? එසේ තීරණය වී තිබේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :————.
10. මෙම නිවේදනයෙහි 12 වැනි ඡේදයෙන් නියමිත පරිදි අවශ්‍ය සුදුසුකම් :—
    උපන් දිනය :————.
    වයස :—අවුරුදු :————, මාස :————, දවස් :————.
    (1973 සැප්තැම්බර් 1 වැනිදා වන විට)
    උපන් ස්ථානය :————.
    රටවැසි බව :—
    උත්පත්තියේදී :————.
    දැනට :————.
    (අ) යෝග්‍යතාව :————.
    (ආ) ඔබ සතු අධ්‍යාපනික සුදුසුකම් :————.
    (එනම්, 12 වැනි ඡේදයේ ඔබේ සුදුසුකම්වලට අදාළ වන විගත්තිය)
    (ඇ) උස :—අඩි :————, අඟල් :————.
    (ඈ) පපුවෙහි පළල :—අඟල් :————.
    (ඉ) බර :—රාත්තල් :————.
11. අතිරේක සුදුසුකම් (මෙහි පහත සඳහන් කොටස් යටතේ දක්වෙන විශේෂ සුදුසුකම් සනාථ කිරීමට ඉල්ලුම්කරුවන්ට හැකි විය යුතුය.) :————.
12. ක්‍රීඩා වලින් ලැබූ ජයග්‍රහණ පිළිබඳ විස්තර :————.
    (ක්‍රීඩා කණ්ඩායම්වල හා තරඟවල විස්තරද, දිනයන්ද ලැබූ ජයග්‍රහණවල තත්ත්වයන්ද දක්වන්න.)
13. පාසැලෙහිදී නැතහොත් විශ්ව විද්‍යාලයෙහි දී ලැබූ වෙනත් ජයග්‍රහණ :————.
14. සන්නද්ධ හමුදාවක නිත්‍ය නොහොත් ස්වේච්ඡා සේවයෙහි හෝ බැල දක්ෂ ව්‍යාපාරයක සේවයෙහි හෝ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර :————.
15. කිසියම් විශේෂ සුදුසුකමක් වේනොත් ඒ පිළිබඳ විස්තර : ————.
16. මෙම ඉල්ලුම් පත්‍රයට අමුණා ඇති ලියවිලි (එවිය යුත්තේ පිටපත් පමණි) :————.
17. චරිත සහතික ලබාගත් අයගේ නම් :————.
18. මෙම ඉල්ලුම් පත්‍රයට අමුණා ඇති වෙනත් ලියවිලි :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8-481—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ආධුනිකත්ව**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත සඳහන් අංශ හතරේ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

ආධුනිකත්ව — ගුවන් නියමු
,, — කාර්මික
,, — උපකරණ
,, — පාලන/රෙජිමේන්තු

මෙම නිවේදනයේ 10 වෙනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් ඇති අයගෙන් මේ සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයන් පුහුණුව සාර්ථක ලෙස අවසන් කළ පසු ජනාධිපති උතුමාණන් විසින් ඔවුන් වෙත පයිලට් ඔෆිසර් තනතුර පිළිබඳ නිත්‍ය අධිකාරිය පිරිනමනු ඇත.

ආධුනිකත්වය සඳහා තෝරාගනු ලැබූ අවස්ථාවේදී—

2. (අ) අපේක්ෂකයින් විසින් තමන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පස් අවුරුදු කාලසීමාවක් නිත්‍ය හමුදාවේ සේවය කරන බවට බැඳී ඇතුළු විය යුතුය.

(ආ) අපේක්ෂකයින් විසින් ගුවන් හමුදාධිපතිවරයාගේ උපදෙස් අනුව ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලබන පරිදි දිවයිනේ හෝ විදේශයක පුහුණුවක් ලැබීම සඳහා සූදානමින් සිටිය යුතුය.

(ඇ) පුහුණුවීමේ කාලසීමාව තුළදී සියළු ආධුනිකයන් ගුවන් හමුදා නීතියට යටත් විය යුතුය.

(ඈ) **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම.**—රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා තම දායක මුදල් වශයෙන් තම ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක මුදලක් අඩුකර ගැනීම ගැන තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක්, බඳවා ගැනීමේදී සෑම ආධුනිකයෙකු විසින්ම දියයුත්තේ ය.

(ඉ) පුහුණුවීමේ කාලසීමාව තුළදී සියළු ආධුනිකයන්ට වර්ෂයකට රු. 5,160 ක ඒකාබද්ධ වැටුපක් ගෙවනු ලැබේ. ආධුනිකයන් හැටියට සේවය කරන කාලසීමාව තුළදී ඔවුනට කිසිදු වේතන වැඩිවීමකට හිමිකමක් නැත.

(ඊ) පියසර පුහුණුව ලබන සැම ආධුනිකයෙකුටම තම සාමාන්‍ය වැටුපට අමතරව දිනකට රු. 1ක පියසර උපදෙස් දීමනාවක් ද, ජෙට් ගුවන් යානා පදවන ආධුනිකයින්ට තමා අඩුම ගණනේ ජෙට් ගුවන් යානයක පැය 20 ක් ඇතුළුව පියසර පැය 30 ක් පුහුණුව ලබා ඇත්නම් දිනකට රු. 4ක පියසර වැටුපක් ද ගෙවනු ලැබේ.

(උ) සියළුම ආධුනිකයන්ට සිය ආධුනික කාලසීමාව තුළදී රජයේ වියදමින් සියළු ආයිත්තම් සහිත නිල ඇඳුම්, අවශ්‍ය දැ හා වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඌ) පුහුණුවීමේ කාලසීමාව තුළදී ආධුනිකයන්ට ගුවන් හමුදා නිවස්නයක නැවතීමට ඉඩකඩ හා කෑම සපයනු ලැබේ. ඔහු විසින් කෑම සඳහා යන වියදම සහ (නිවස්නයට) සිය කල්පික මූලික වැටුපෙන් 3½% කුළියක් ද ගෙවිය යුතු වේ.

(එ) (i) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළදී යම්කිසි ආධුනිකයෙකුට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගන්නට අවශ්‍ය වුවහොත්, ශ්‍රී ලංකා ජනරජය විසින් එම ආධුනිකයා වෙනුවෙන් ඒ වන තෙක් දරා ඇති සියළු වියහියදම් එම ආධුනිකයාගේ මව හෝ පියා හෝ භාරකරු හෝ විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුය.

(ii) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවකදී යම්කිසි ආධුනිකයෙකු නොමනා හැසිරීම් හෝ තමා විසින් වගකිවයුතුවූ කිසියම් හේතුවක් හෝ නිසා අධිකාරියක් පිරිනමනු ලැබීමට යෝග්‍ය නොවේ යයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම්, එම අවස්ථාවේදී එම ආධුනිකයාගේ මව හෝ පියා හෝ භාරකරු හෝ විසින් ඒ වනතෙක් ශ්‍රී ලංකා ජනරජය ඔහු වෙනුවෙන් දරා ඇති සියළුම වියහියදම් ආපසු ශ්‍රී ලංකා ජනරජයට ගෙවිය යුතුය.

(ඒ) මව හෝ පියා හෝ භාරකරුවන් විසින් ඉහත සඳහන් (එ) (i) හා (ii) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි පහත 21 වෙනි ඡේදයෙහි දක්වා ඇති අයදුම්පත් පෝර්මයේ 21| වෙනි කොටුවේ සඳහන් ප්‍රකාශයන් අත්සන් කර අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු වේ. තෝරාගනු ලබන අපේක්ෂකයන් බඳවා ගැනීමට පෙර, ඔවුන්ගේ දෙමාපියන් හෝ භාරකාරයින් විසින් ශ්‍රී ලංකා ජනරජය සමඟ මේ බව තහවුරු කෙරෙන ඇප ඔප්පුවකට බැඳිය යුතුය.

(ඔ) පුහුණුව සාර්ථක ලෙස අවසන් කරනු ලැබූ ආධුනිකයන්ට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඒ ඒ අංශවල පයිලට් ඔපිසර් නිලයේ තබෘ අධිකාරීන් පිරිනමනු ලැබේ. අධිකාරියට පත්කරනු ලැබීමත් සමඟම ඔවුන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ ආධුනිකයන් වශයෙන් ඇති කරගත් බැඳීම් ද අවසන් වේ. අධිකාරිය පිරිනමනු ලැබීමෙන් පසුව, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අඩු වශයෙන් අවුරුදු පහක් (5) ඔවුන් විසින් සේවය කළ යුතුය.

අධිකාරිය ලැබූ පසු ලැබෙන වැටුප් හා දීමනා :

3. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරීය ලත් නිලධාරියෙකුගේ වැටුප්, දීමනා හා සේවා කොන්දේසි පහත සඳහන් අයුරින් වේ :—

(අ) **ඒකාබද්ධ වැටුප**

පයිලට් ඔපිසර්—වර්ෂයකට රු. 5,880

ප්ලයිං ඔපිසර්—රු. 7,500—5×180=වර්ෂයකට රු. 8,400

ප්ලයිට් ලෙප්ටිනන්ට්—රු. 9,240—8×180=වර්ෂයකට රු. 10,680.

ස්කොඩ්රන් ලීඩර්—රු. 11,400—8×240=වර්ෂයකට රු. 13,320.

(විං කොමාන්ඩර් හා ඉන් ඉහළ තනතුරු සඳහා අදාල ප්‍රමාණයන් පිළිබඳ විස්තර අවශ්‍ය නම් මෙම මූලස්ථානයෙන් ලබාගත හැකිය.)

(ආ) **විවාහක දීමනාව.**—විවාහක නිලධාරියකුට රජයේ සේවයේ නිලධාරින්ට අදාළ වන රේට් ගණන් සහ කොන්දේසිවලට අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) **පියසර වැටුප.**—සාමාන්‍ය රාජකාරි ශාඛාවේ නියුක්ත නිලධාරීන්ට (නියමුවන්ට) ඔවුන්ගේ සාමාන්‍ය වැටුපට අතිරේක වශයෙන් පහත සඳහන් රේට් ගණන්වලට අනුව පියසර වැටුපක් ද ගෙවනු ලැබේ.

| | | |
|---|---|---|
| පයිලට් ඔපිසර් දිනකට | ... ... | රු. 8.00 |
| ප්ලයිං ඔපිසර් දිනකට | ... ... | රු. 8.89 |
| ප්ලයිට් ලෙප්ටිනන්ට්, ස්කොඩ්රන් ලීඩර්, දිනකට | | රු. 9.77 |

(විං කොමාන්ඩර් නිලයට සහ ඉන් ඉහළ නිලවලට අදාළ රේට් ගණන් අවශ්‍ය නම් මෙම මූලස්ථානයෙන් ලබාගත හැකිය.)

(ඈ) අධිකාරලත් පසු, සර්ම කලාපීය ඇඳුම් මිලදී ගැනීම සඳහා රු. 1,000ක ආරම්භක පරිෂ්කාර දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුවීම සඳහා පිටරටකට (සමශීතෝෂ්ණ දේශගුණයකට) අනුයුක්ත කරනු ලැබූ විට තවදුරටත් රු. 1,300 ක පරිෂ්කාර දීමනාවක් ගෙවනු ලැබේ. අධිකාර ලැබ මාසයක් ගතවූ පසු නිල ඇඳුම් පවත්වා ගැනීමේ දීමනාවක් වශයෙන් මසකට රු. 25 ක මුදලක් ගෙවනු ලැබේ. පුහුණුව අවසන් කිරීමෙන්/අධිකාර ලැබීමෙන් පසු නිලධාරියා තබා ගන්නා නිල ඇඳුම්වල වටිනාකම ආරම්භක පරිෂ්කාර දීමනාවෙන් අඩු කරනු ලැබේ.

(ඉ) අනෙකුත් දීමනා (වෙන්වීමේ දීමනාව, විදේශීය දීමනා, ඒකාබද්ධ දීමනාව, ආදීය) ගෙවනු ලබන්නේ ගුවන් හමුදා රෙගුලාසිවල නියම කර ඇති පරිදිය.

4. **රාජ්‍ය සේවා අර්ථසාධන අරමුදලට දායක මුදල් ගෙවීම.**—රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා තම දායක මුදල් වශයෙන් තම ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක මුදලක් අඩු කර ගැනීම ගැන තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක්, සෑම නිලධාරියෙකු විසින්ම දිය යුත්තේ ය.

**අධිකාර ලත් පසු අදාළ කොන්දේසි :**

5. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියකුට අදාළ වනුයේ 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන ශ්‍රී ලංකා ජනරජ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උසස්වීම් මාර්ග සහ සේවා කොන්දේසිය.

6. අවිවාහක නිලධාරියකු නිලධාරීන්ගේ මෙස් භෝජනාගාරයෙහි විසිය යුතුය. බඩු මුට්ටු සහිත නවාතැන් පහසුකම් සහ ආහාර පාන ද ඔහුට සපයනු ලැබේ. ඔහුගේ කල්පිත මූලික වැටුපෙන් සියයට 7 ක ගෙවල් කුලියක් මේ සඳහා අයකර ගනු ලැබේ. ආහාර පාන සඳහා ද ඔහු විසින් ගෙවිය යුතුය. බැට්මන් සේවය ශ්‍රී ලංකා ජනරජයේ වියදමින් සපයනු ලැබේ.

7. විවාහකයින්ගේ නිවාස තිබේ නම් ලී බඩු සහිත එම නිවාසයක් විවාහක නිලධාරියකුට සපයනු ලැබේ. මේ සඳහා ගෙවල් කුලිය කපා ගන්නේ රජයේ සේවකයන්ට අදාළ වන අයුරින්මය. එවැනි නිලධාරියකුට මසකට රු. 75 ක බැට්මන් දීමනාවක් ද ගෙවනු ලැබේ.

8. ගුවන් හමුදා නිලධාරීහු රාජකාරිය හෝ පුහුණුව සඳහා ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට ඕනෑම වේලාවකදී අනුයුක්ත කරනු ලැබීමට යටත් වෙති.

9. තෝරාගනු ලබන අපේක්ෂකයන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසත් විශේෂයෙන් 1956 යේ අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිසත් දැනට පනවා ඇත්තාවූ ද මතු පනවනු ලබන්නා වූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

**අවශ්‍ය මූලික සුදුසුකම් :**

10. (අ) **ජාතිය.**—අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුය. එනම්—

(i) පරම්පරාවෙන් ; හෝ

(ii) ලියාපදිංචි වීමෙන් ;

ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ආ) **වයස.**—1973 සැප්තැම්බර් 1 වැනි දිනට අපේක්ෂකයන්ගේ වයස අවුරුදු 17යි මාස 6කට නොඅඩු හෝ අවුරුදු 22ට නොවැඩි හෝ විය යුතුය. එතෙකුදු වුවත් උපාධිධාරීන් සම්බන්ධයෙන් නම් 1973 සැප්තැම්බර් 1 වැනි දිනට වයස අවුරුදු 28 ට අඩු අය ගැන ආධුනිකත්වය සඳහා සලකා බලනු ලැබේ.

(ඇ) **අධ්‍යාපනය.**—පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් අපේක්ෂකයන් සතුවිය යුතුය :—

(i) **පොදු සේවා (නියමු) අංශය :**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව විෂයයන් හයකින් සමත් වී තිබිය යුතුය.

(ආ) (පිළිගත් විශ්ව විද්‍යාලයක) උපාධිධාරියකු නම් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, භෞතික විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන් ගෙන් සමත් වී සිටිය යුතුය.

(ii) **කාර්මික අංශය :**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ දී ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් සම්මාන සහ ඉංග්‍රීසි භාෂාව සමග විෂයයන් හයකින් සමත් වී තිබිය යුතුය.

(ආ) (පිළිගත් විශ්ව විද්‍යාලයක) උපාධිධාරියෙකු නම් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් සම්මාන සහිතව, ඉංග්‍රීසි භාෂාවද තිබිය යුතුය.

(iii) **උපකරණ හා පරිපාලන/රෙජමේන්තු අංශය**

(අ) විෂයයන් හයකින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර, ගණිතයෙන් අනිවාර්යයෙන්ම සමත් විය යුතුයි.

(ආ) (පිළිගත් විශ්ව විද්‍යාලයක) උපාධිධාරීන් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය පිළිබඳ සාමාර්ථය අනිවාර්යය.

15. පාසලේ දී නැතහොත් විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධාන වලට සම්බන්ධව හෝ වෙනත් අංශවලින් ඔබ දක්වා ඇති සමත්කම් (දිනයන් සමග විස්තර දක්වන්න)

........................................................................

........................................................................

........................................................................

16. නිත්‍ය හමුදා සේවයක, ස්වේච්ඡා බලකායක නැතහොත් බාල දක්ෂ සංවිධානයක කලින් සේවය :—

(එම සේවයේ නොහොත් සංවිධානයේ නම සඳහන් කොට දැරූ ඉහළ ම තරාතිරම හා සේවා කාල සීමාව දක්වන්න)

........................................................................

........................................................................

........................................................................

17. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (නිදසුනක් : ගුවන් යානා පැදවීම පිළිබඳව යම් යෝග්‍යතා පරීක්ෂණයකට ඔබ පෙනී සිට ඇතොත් එය දිනයන් සමග විස්තර සඳහන් කරන්න) :————.

" ඇ " චරිත සහතික : (මෙම නිවේදනයේ 18 වන ඡේදය හා සම්බන්ධයි)

18. විස්තර :————.

නම පදවි නාමය දුන් ලිපිනය

" ඉ " ප්‍රකාශයෝ :

19. අයදුම්කරු අත්සන් තැබිය යුතු ප්‍රකාශය :

ඉහත සඳහන් ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මගේ සම්පූර්ණ දැනුමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බැව් මගේ ගෞරවයේ නාමයෙන් මෙයින් ප්‍රකාශ කර සිටිමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් විෂයයෙහි යොදාගනු ලබන කාර්ය පටිපාටිය හා ඔවුන් විෂයයෙහි අදාළ වන ව්‍යවස්ථා මම කියවා අවබෝධ කොට ගතිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : 1973 ————.

20. අයදුම්කරුගේ පියා/මව/භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය.

(අ) මම, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයක් සඳහා අයදුම්කරුවකු වූ ද මෙහි ඉහත දැක්වෙන අයදුම් පත්‍ර ෆෝරමයෙහි 19 වන කොටුවේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට ඇත්තා වූ ද ..................... ගේ පියා*/මව/භාරකරු වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් මෙයින් භාර ගනිමි :—

(i) පුහුණුව ලබන කාල සීමාව තුළ දී ඉහත නම් සඳහන් අයදුම්කරු අධිකාරයක් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් දරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(ii) (විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම පාලනය කර ගත හැකි හේතු නිසා) ඉහත නම සඳහන් අයදුම්කරු අධිකාරයක් ලැබීමට සුදුසු නොවෙ තැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන ලද සියලු ම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

————,
*පියාගේ/මවගේ/භාරකරුගේ අත්සන.

දිනය : 1973
නම (පැහැදිලි අකුරෙන්) :————.
ලිපිනය :————.
සාක්ෂිකරුගේ අත්සන :————.
නම (පැහැදිලි අකුරෙන්) :————.
ලිපිනය :————.
(*අදාළ නොවන වචන කපා දමන්න).

(පී. එච්. මෙන්ඩිස්),
එයාර් කොමදෝර්,
ගුවන් හමුදාපති.

1973 අගෝස්තු 10,
කොළඹ, තැ. පෙ. අංක 594,
ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ දීය.

8-480 —73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලය

### තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලයේ පහත දැක්වෙන තනතුරු සඳහා අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන ආකෘතියකට අනුව පිළියෙල කොට 1973 අගෝස්තු 24 දින හෝ ඊට පෙර " පුවත් පත් කොමසාරිස්, ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලය, ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය, අංක 7, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 1 " යන ලිපිනයට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ " ............තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය " යි යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය හිමිය. මෙම තනතුරු වලට පත් කරනු ලබන්නෝ අවුරුදු තුනක පරිවාස කාල සීමාවකට යටත්වෙය.

සෑම ඉල්ලුම් කරුවකුම තමා ඉල්ලන තනතුරට නියමිත සුදුසුකම් ලබා ඇති බවට සහතික ඉදිරිපත් කළ යුතු වන්නේය. ඉල්ලුම් පත්‍රය සමග පහත දැක්වෙන සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය.

1. උප්පැන්න සහතිකය.
2. උසස් අධ්‍යාපන සහතික
3. මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්

(රජයේ සේවකයන් චරිත සහතික ඉදිරිපත් කළයුතු නැති මුත් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් නිර්දේශ කොට තිබිය යුතුය.)

මෙම ගැසට් පත්‍රයේ පළමුවන කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රජයේ තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කර වනු ලැබේ.

පුවත් පත් කොමසාරිස්.

ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය,
7, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1,
73. 08. 01.

### ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලයේ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ නම :————.
   අගට යෙදෙන නම :————.
   අනෙක් නම් :————.
2. ලිපිනය :————.
3. වයස :————.
   1. අවුරුදු (73.08.31 දිනට)
   2. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)
4. ජාතිය :————.
5. විවාහක/අවිවාහක බව :————.
6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————,
   1.
   2.
   3.
   4.

7. පාඨශාලාවෙන් අස් වූ පසු කළ රැකියා/හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතු : ————.

9. සාපරාධී වරදකට උසාවියකින් කෙදිනක හෝ දඬුවම් විඳ තිබේ නම් වරද හා දඬුවමේ විස්තර:————.

10. චරිත සහතික ලබාගත් පුද්ගලයන් ගේ නම් ගම් හා පදවිනාම : ————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම් තොරතුරක් අසත්‍ය සෝ වැරදි හෝ බව මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් මගේ අපේක්ෂකත්වය අහිමි වන බවත් පත් කිරීමෙන් පසුව හෙළි වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවටත් එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

තනතුරු පුරප්පාඩු

තනතුර.—පර්යේෂණ නිලධාරී (තනතුරු 1යි)

වැටුප.—මාසික (සියලු දීමනා ඇතුලුව) රු. 800— 10×10 හා 1×50 —1250. රු. 920 වැටුප් තලයේ නැබීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. (එම තලයේ නැබීමට පෙර පශ්චාත් උපාධි සහතිකයක් ලැබිය යුතුය) පළපුරුදුකම් ඇති අය සුදුසු වැටුප් තලයක නැබීම සළකා බලනු ලැබේ.

සුදුසුකම් :

(i) 73. 08. 31 දිනට වයස අවුරුදු 25-40 අතර විය යුතුය. (උපරිම වයස් සීමාව රජයේ හෝ සංස්ථා සේවකයනට අදාල නොවේ)

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද උපාධියක් සමග බහුජන මාධ්‍ය ප්‍රචාරක කටයුතු ගැන පර්යේෂණ පළපුරුද්ද ලබා තිබිය යුතුය.

2. තනතුර.—ලිපිකරු, II ශ්‍රේණිය (තනතුරු 1 යි)

වැටුප.—මාසික (සියලු දීමනා ඇතුලුව). රු. 350—15×15—575 රුපියල් 395 වැටුප් තලයේ නැබීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. (පළපුරුද්ද අනුව සුදුසු වැටුප් තලයක නැබීම ගැන සළකා බලනු ලැබේ.)

සුදුසුකම් :

(අ) 73.08.31 දිනට වයස අවුරුදු 25ට නොඅඩු විය යුතුය.

(ආ) රජයේ සාමාන්‍ය ලිපිකරු සේවයේ 2 වන පන්තියේ යෝග්‍යතා "අ" ඛණ්ඩ විභාගයෙන් සමත් හෝ එම පංතියේ "ආ" ඛණ්ඩයෙහි අවුරුදු 5ක සේවයක් ඇති ලිපිකරුවන් නැතහොත්, රජයේ සංස්ථාවක 3 වන ශ්‍රේණියේ ලිපිකරුවකු වශයෙන් අවුරුදු 5 ක සේවයක් ඇති ලිපිකරුවන් නැතහොත්, පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රථම පරීක්ෂණයෙන් සමත්ව සිටිය යුතුය.

3. තනතුර.—ලිපිකරු/යතුරු ලේඛක (තනතුරු 3 යි)

වැටුප.—මාසික (සියලු දීමනා ඇතුලුව) රු. 265—16×10—425 (රු. 295 වැටුප් තලයේ නැබීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

සුදුසුකම් :

(අ) 73.08.31 දිනට වයස අවුරුදු 18-24 අතර විය යුතුය.

(ආ) අ. පො.ස. (සා. පෙ.) විභාගය විෂයයන් 6 කින් එකවර සමත් විය යුතුව ඇති අතර, භාෂාව හා අංක ගණිතය සහිත සම්මාන විෂයයන් හතරක් දෙවරකින් නොවැඩි වාර ගණනකින් සමත් විය යුතුයි.

හෝ

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අංක ගණිතය සහ භාෂාව සහිත සම්මාන විෂයයන් හතරකින් යුත් සමාන අධ්‍යාපන සුදුසුකම්.

(ඈ) යතුරු ලිවීමේ දැනීමක් අත්‍යාවශ්‍යය.

4. තනතුර.—විමර්ශන නිලධාරී (තනතුරු 2 යි)

වැටුප.—මාසික (සියලු දීමනා ඇතුලුව) රු. 525—5×20 හා 8×25 —රු. 825 (රු. 650 වැටුප් තලයෙහි නැබීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

සුදුසුකම් :

(අ) 73.08.31 දිනට වයස අවුරුදු 25 ත් 35 ක් අතර විය යුතුය. (උපරිම වයස් සීමාව රජයේ හෝ සංස්ථා සේවකයන් කෙරෙහි බලපාන්නේ නැත.)

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු විය යුතුය. සිංහල, ඉංග්‍රීසි, දෙමළ හෝ භාෂා තුනම ගැන මනා දැනුමක් තිබිය යුතුය.

නැතහොත්,

පිරිවැය හා කළමනාකරු ගණකාධිකාරී විභාගයේ I වන සහ II කොටස් සමත් විය යුතුයි. ඔවුනට විමර්ශන පළපුරුද්ද තිබිය යුතුය.

නැතහොත්,

රජයේ හෝ සංස්ථාවක විමර්ශන නිලධාරියකු වශයෙන් අවුරුදු 3 ක අවම පලපුරුද්ද තිබිය යුතුය.

5. තනතුර.—ඛියවන්නා (තනතුරු 3 යි)

වැටුප.—මාසික (සියලු දීමනා ඇතුලුව) රු. 350—15×15—රු. 575 (රු. 395 වැටුප් තලයෙහි නැබීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.)

සුදුසුකම් :

(අ) 73.08.31 දිනට වයස අවුරුදු 20-35 ත් අතර විය යුතුය.

(ආ) අ. පො. ස. (සා. පෙ.) විභාගය සම්මාන හයක් සහිතව විෂයයන් 6 කින් එක්වර සමත් වී සිටිය යුතු ව ඇති අතර, එක් සම්මාන විෂයයක් භාෂාවක් විය යුතුය.

නැතහොත්,

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත්ව සිටිය යුතුය.

එසේ නැතහොත්,

සමාන අධ්‍යාපන සුදුසුකම් ලබා සිටිය යුතුය.

6. තනතුර.—භාෂණ හා භාෂා පරිවර්තක (තනතුරු 2 යි)

වැටුප.—මාසික (සියලු දීමනා ඇතුලුව) රු. 350—15×15—රු. 575 (රු. 395 වැටුප් තලයෙහි නැබීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

සුදුසුකම් :

(I) 73.08.31 දිනට වයස අවුරුදු 30-45 ත් අතර විය යුතුය. (උපරිම වයස් සීමාව රජයේ හෝ සංස්ථා සේවකයනට බලපාන්නේ නැත)

(II) අධ්‍යාපන—

(අ) ලන්ඩන් අ. පො. ස. (උසස් පෙල) සිංහල හෝ දෙමළ සහතිකය

හෝ

අ. පො. ස. (උසස් පෙල) සිංහල හෝ දෙමළ සහතිකය

හෝ

සිංහල හෝ දෙමළ (විශේෂ සිංහල හෝ දෙමළ නොවේ) විෂයයක් සහිත උසස් පාඨශාලා සහතිකය

හෝ

සිංහල හෝ දෙමළ විෂය සහිත ලන්ඩන් ඉන්ටර් ආර්ට්ස් සහතිකය/ලංකා විශ්ව විද්‍යාල සාමාන්‍ය කලා යෝග්‍යතා (ප්‍රථම) විභාග සහතිකය

සහ

(ආ) ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යයට සම්මාන ඇතිව 1957 ජූලි මාසයට පෙර නිකුත් කළ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය

හෝ

අ. පො. ස. (සාමාන්‍ය) විභාගයේදී සිලබස් "ඒ" ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය

හෝ

සමාන උසස් විභාගයකින් ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථ ලබා සිටීම

සහ

(ඇ) සිලබස් "ඒ" ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ඇතිව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් සාමාර්ථය ලබාගත් අ. පො. ස. (සාමාන්‍ය) සහතිකය.

(III) භාෂණ හා භාෂා පරිවර්තනය පිළිබඳ අවුරුදු 5 ක අවම පළපුරුද්දක් තිබිය යුතුය

**එසේ නැතහොත්**

අධිකරණ/අධිකරණ මණ්ඩලවල භාෂණ පරිවර්තන වැඩ පළ පුරුදු නිලධාරීන් විය යුතුයි. ඔවුනට ඉහත සඳහන් සුදුසුකම් අවශ්‍ය නොවේ.

**7. තනතුර.**—ආරක්ෂක හා ප්‍රවාහන නිලධාරී (තනතුරු 1 යි)

වැටුප—මාසික (සියලු දීමනා ඇතුලුව) රු. 350—15×5—රු. 575 (රු. 395 වැටුප් තලයට පෙර කාර්යක්ෂමතා කඩයිමකි.)

**සුදුසුකම් :**

(අ) 73.08.31 දිනට වයස අවුරුදු 18—35 ත් අතර විය යුතුය. (උපරිම වයස් සීමාව රජයේ හෝ සංස්ථා සේවකයනට බලපාන්නේ නැත).

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කට සම්මාන ලබා එක් වරකදී විෂයයන් 6 කින් සමත් වූ අ. පො. ස, (සාමාන්‍ය) සහතිකය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය.

(ඇ) මනා ශරීර සෞඛ්‍යයෙන් යුත් අය ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) රථවාහන පැදවීමට පළපුරුද්ද හා බලපත්‍ර ලබා සිටිය යුතුය.

(ඉ) පොලිස් හෝ හමුදා සේවාවල නියුක්තව සිටි අය ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

8—526 —73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

අංකය : විඅා/4/158.

**අධ්‍යාපන අමාත්‍යාංශය**

1973 හොංකොං පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

1974 අධ්‍යයන වර්ෂයේ ආරම්භයේ සිට හොංකොං විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ක්‍රමය යටතේ පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරෙනුයේ පහත සඳහන් විෂයයන්ගෙන් කිසිවක පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණය සඳහාය :—

(1) අධ්‍යාපනය
(2) චීන භාෂාව
(3) ජීව රසායන විද්‍යාව
(4) උද්භිද විද්‍යාව
(5) රසායන විද්‍යාව
(6) ගණිතය
(7) භෞතික විද්‍යාව
(8) සත්ව විද්‍යාව
(9) සිවිල් ඉංජිනේරු විද්‍යාව
(10) විදුලිය ඉංජිනේරු විද්‍යාව
(11) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1 :** රජයේ සේවකයන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම්පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්ෂය 3 :** එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

**2. ශිෂ්‍යත්ව කාලය :** ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් වර්ෂ දෙකක් වන්නේ ය.

එහෙත් අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ හොංකොං බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියට තමාගේම වියදමින් ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට නියෝග කරීමට ඉඩ ඇත්තේ ය.

**3. සුදුසුකම් :** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි. :—

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1974.10.1 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩුවිය යුතුයි.

(iii) යටත් පිරිසෙයින් හැදෑරීමට අදහස් කරන විෂයයෙහි පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා උචිත (පිළිගත් විශ්ව විද්‍යාලයක) උපාධියක් තිබිය යුතුය.
(ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම්පත් භාරගනු ලැබේ.)

(iv) උසස් ඉංග්‍රීසි ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

**සංලක්ෂය 1 :** ශ්‍රී ලංකා ජන රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ ශ්‍රී ලංකා ජන රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාලසීමාවේ සේවය සම්පූර්ණ කොට 1974.10.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂය 2 :** එසේ ම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළයුතුය.

**4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන් :** ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුලත් ය :—

(අ) හොංකොං බලා යාම හා ආපසු පැමිණීම සඳහා ගමන් පහසුකම් (සාමාන්‍යයෙන් ඉතාම කෙටි ගුවන් මගින්)

(ආ) විශ්ව විද්‍යාල ගාස්තු ;

(ඇ) මසකට හොංකොං ඩොලර් 1200 බැගින් යැපීම් දීමනාවක් ;

(ඈ) වර්ෂයකට හොංකොං ඩොලර් 400 ක හෝ හොංකොං වලින් පිටතදී වියදම් කෙරෙන්නේ නම් පවුම් 25 ක පොත් හා උපකරණ දීමනාවක් ;

(ඉ) වර්ෂයකට හොංකොං ඩොලර් 400 ක අතිරේක ගමන් දීමනාවක් ;

(ඊ) (අවශ්‍ය වුවහොත්) හොංකොං ඩොලර් 640ක හෝ හොංකොං වලින් පිටත දී වියදම් කරන්නේ නම් පවුම් 40ක ඇඳුම් දීමනාවක් ;

(උ) වෛද්‍ය පහසුකම් :— සාමාන්‍ය විශ්වවිද්‍යාල සෞඛ්‍ය සේවය හා රජයේ ආරෝග්‍යශාලාවන්හි නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර. ආරෝග්‍යශාලාවන්හි නැවතී සිටීමේ දී ගෙවිය යුතු ගාස්තු, දන්ත හා නයනාබාධ ප්‍රතිකාර හා ශ්‍රව්‍ය ආධාර හා උපකරණ මේ පහසුකම් වලට ඇතුලත් නොවේ.

(ඌ) අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ විවාහකව සිටි අපේක්ෂකයාට අතිරේක යැපීම් දීමනාවක්, එවැනි අය තමන් විසින්ම නවාතැන් සපයාගත යුතුය. භාර්යාවගේ ගමන් වියදම් ගෙවනුයේ ද එම කොන්දේසි යටතේ ය.
(මෙම දීමනා සඳහා හොංකොං වලදී බදු අයකරනු නොලැබේ.

**සංලක්ෂය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නිතිරීතීන්ට යටත්වන්නේ ය.

**5. සම්මුඛ පරීක්ෂණය :** සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය, හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

**6. ගිවිසුම :** තෝරාගනු ලබන අපේක්ෂකයන් හොංකොං බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය විසින් නියම කරනු ලබන යම්කිසි කාල සීමාවක් තුළ ශ්‍රී ලංකා ජන රජය යටතේ සේවය කිරීමටද,

(ආ) තමාගේ ශිෂ්‍යත්වයේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජන රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියළුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ශ්‍රී ලංකා ජන රජයට ආපසු ගෙවීමට ද, පොරොන්දුවන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය :** තෝරාගනු ලබන අපේක්ෂකයන් හොංකොංහි අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට ද ශ්‍රී ලංකා ජන රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබා දීමට ශ්‍රී ලංකා ජන රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාම යෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළ හොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ශ්‍රී ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රධානය සඳහා කමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතියයුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රධාන කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රධාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනය හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන් සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1973.8.25 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කල යුතුය.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතන වල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද, මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන් අදාල අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මාර්ගයෙන් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 20 වැනි දා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

8-458—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ගමනාගමන මණ්ඩලය**

**පුරප්පාඩු**

මෙම ආයතනයේ ඉංජිනේරු කොට්ඨාශයේ පවතින පහත සඳහන් පුරප්පාඩු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

(1) **I වෙනි පෙළ මෝස්තර සාදන්නා :**

**සුදුසුකම් :**

(අ) වයස.—1973.08.25 වෙනි දිනට අවුරුදු 20 ටත් 45 ටත් අතර වීම ;
(ආ) අධ්‍යාපනය.—8 වෙනි ශ්‍රේණිය සමත්වීම ;
(ඇ) වෘත්තීය පළපුරුද්ද.—පිළිගත් ආයතනයක මෝස්තර සෑදීම පිළිබඳ පූරා අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතුයි. සැලැස්මක් කියවීමට සහ තේරුම් ගැනීමට හැකියාවක් තිබිය යුතු අතර ඒ පිළිබඳ මනා දැනීමක් ද තිබිය යුතුයි.

වැටුප් ක්‍රමය.—සියළු දීමනාවන් ඇතුළුව මසකට රු. 280—10×12—රු. 400 දක්වා.

(2) **II වෙනි පෙළ මෝස්තර සාදන්නා :**

**සුදුසුකම් :**

(අ) වයස.—1973.08.25 වෙනි දිනට අවුරුදු 20 වත් 45 වත් අතර වීම ;
(ආ) අධ්‍යාපනය.—8 වෙනි ශ්‍රේණිය සමත්වීම ;
(ඇ) වෘත්තීය පළපුරුද්ද.—පිළිගත් ආයතනයක මෝස්තර සෑදීම පිළිබඳ පූරා අවුරුදු 7 ක පළපුරුද්දක් තිබිය යුතුයි. සැලැස්මක් කියවීමට සහ තේරුම් ගැනීමට හැකියාවක් තිබිය යුතු අතර, ඒ පිළිබඳ මනා දැනීමක්ද තිබිය යුතුයි.

වැටුප් ක්‍රමය.—සියළු දීමනාවන් ඇතුළුව මසකට රු. 220—5×4—10×9—රු. 330 දක්වා.

(3) නියමිත සුදුසුකම් ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට සහ වෘත්තීය පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසු තෝරාගනු ලබන අතර තෝරාගනු ලබන අයවලුන් පළපුරුද්ද සහ සුදුසුකම් අනුව අදාළ වැටුප් ක්‍රමයෙහි නිසි වැටුප් පියවරක තැබීමට කටයුතු කරනු ඇත.

(4) සුදුසුකම් ඇති අයදුම්කරුවන් මෙහි පහත දැක්වෙන ආදර්ශ ඉල්ලුම් පත් පෝරමය ඉනුව ඉල්ලුම් පත්‍ර පිළියෙල කර කොළඹ 5, 200 වෙනි ස්ථානයේ, කිරුළ පාරේ ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1973.08.25 වෙනි දින හෝ ඊට පෙර එවිය යුතුයි.

(5) අයදුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ උඩුපස වම් කෙළවරේ (පීබී/ඇප්) ශාඛාව යන්න සඳහන් කරන්න.

සේවක මණ්ඩල කළමනාකාර තැන.
ලංකා ගමනාගමන මණ්ඩලය

200, කිරුළ පාර,
[illegible]

**ආදර්ශ ඉල්ලුම් පත්‍ර ෆෝර්මය**

I/II වෙනි පෙළ මෝස්තර සාදන්නන්ගේ තනතුරක්

1. ඉල්ලුම් කරන තනතුර සහ පංතිය :————.
2. ඉල්ලුම්කරුගේ නම මුලකුරු සමග :————.
3. ලිපිනය :————.
4. උපන් දිනය :————.
   (අ) 73.08.25 වෙනි දිනට වයස : අවු. :——, මාස :——, දින :———.
5. අධ්‍යාපනික සුදුසුකම් (සමත් වූ ඉහළම ශ්‍රේණියත්, භාෂා මාධ්‍යයත්, එනම් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන්න සඳහන් කරන්න.) :————.
6. වෘත්තීය පළපුරුද්ද (වෘත්තීය පළපුරුද්ද ලැබූ පිළිගත් ආයතනයේ නම හා කාලසීමාව සඳහන් කළ යුතු අතර, එම සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුයි.)
7. ආදායම් දිස්ත්‍රික්කය :————.
8. ඡන්ද කොට්ඨාශය :————.

මෙම අයදුම් පත්‍රයෙහි මා විසින් සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, ලේඛනගත සාක්ෂිවලින් ඒවා සනාථ කළ හැකි බවත්, මෙයින් සහතික කරමි. මෙහි යම්කිසි අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව මා තෝරා ගැනීමට පෙර දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට මා නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් අනතුරුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව සේවයෙන් පහකරනු ලබන බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-487—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා හෝටල් පාසැල**

**1973 ඔක්තෝම්බර් මස සිට ආරම්භවන හෝටල මෙහෙයවීම සහ ආහාර සම්පාදනය පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව**

එක් වරකදී විෂයයන් 6 කින් අ.පො.ස. 'සාමාන්‍ය පෙළ' පරීක්ෂණය සමත්වී ඇති, 1973 සැප්තැම්බර් 30 වැනි දිනට අවුරුදු 18 සිට 21 දක්වා වයසැති පිරිමි ළමුන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා ක්‍රියාකාරී දැනුමක් අත්‍යවශ්‍යය.

තෝරාගනු ලබන අයැදුම්කරුවන් විසින් නේවාසිකාගාරයේ නවාතැන් ගතයුතු වන අතර, මසකට රු. 100 ක නේවාසිකාගාර ගාස්තුවක් ගෙවිය යුතුය.

නිල ඇඳුම්, පොත් පත් සහ අන් උපකරණ යනාදිය සඳහා වැය වන සියළු වියදම් ද අභ්‍යාස ලාභියා විසින් දැරිය යුතුය.

සියළුම විස්තර දැක්වෙන අයැදුම්පත්, සහතිකපත්වල පිටපත් සමග, "3 අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව" යන පදය පැහැදිලිව දැක්වෙන ලියුම් කවරයක බහා, 1973 අගෝස්තු 20 වැනි දිනට හෝ ඊට පෙර, කොළඹ, ගාලු මුවදොර මැද පාරේ, අංක 25 දරණ ස්ථානයේ පිහිටි, ලංකා හෝටල් පාසැලේ විදුහල්පති වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

8-433—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය**

ඇබෑර්තු

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයයේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. තම නම සහ ලිපිනය ලියන ලද මුද්දර කවරයක් එවීමෙන් ලබා ගන්නා ඉල්ලුම් පත්‍ර මගින් අයදුම් කළ යුතුය.

**(1) මුදල් කළමනාකාර/ගණකාධිකාරී I වෙනි ශ්‍රේණිය**

**වේතන පරිමාණය.**—තෝරාගනු ලබන අයදුම්කරුගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව පහත සඳහන් වේතන පරිමාණයක් මත තබනු ඇත :—

1. රු. 1,500—6×50—රු. 1,800 (සියලු දීමනා අඩංගුව මාසික)

හෝ

2. රු. 1,850—8×50—රු. 2,250 (සියලු දීමනා අඩංගුව මාසික)

**සුදුසුකම්.**—වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් විශාල වෙළඳ ආයතනයක අඩු වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ඇති වරලත් ගණකාධිකාරිවරයෙකු හෝ පූර්ණ සුදුසුකම් සහිත පිරිවැය සහ වැඩ ගණකාධිකාරීවරයෙකු විය යුතුය.

**ඇපය.**—විශ්වාස ඇප ඔප්පුවක් මගින් රු. 10,000

**(2) ගණකාධිකාරී—III වෙනි ශ්‍රේණිය**

**වේතන පරිමාණය.**—රු. 1,200—6×50—රු. 1,500 (සියලු දීමනා අඩංගුව මාසික)

**සුදුසුකම්.**—අයදුම්කරුවන් වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ පිරිවැය හා වැඩ ගණකාධිකාරී ආයතනයේ හෝ සාමාජිකයෙකු විය යුතුය.

**ඇපය.**—විශ්වාස ඇප ඔප්පුවක් මගින් රු. 10,000

**(3) ගණකාධිකාරී—IV වෙනි ශ්‍රේණිය**

**වේතන පරිමාණය.**—රු. 800—10×40—රු. 1,200 (සියලු දීමනා අඩංගුව මාසික)

**සුදුසුකම්.**—වරලත් ගණකාධිකාරී ආයතනයේ මධ්‍යම පරීක්ෂණයෙන් හෝ පිරිවැය හා ගණකාධිකාරී ආයතනයේ කොටස් I, II සහ III දක්වා විභාගයන්ගෙන් සමත් විය යුතුය. විධායක තනතුරක පළපුරුදුකම් ඇති අයදුම්කරුවන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**ඇපය.**—විශ්වාස ඇප ඔප්පුවක් මගින් රු. 10,000

**(4) සිවිල් ඉංජිනේරු—III වෙනි ශ්‍රේණිය (උඩ වලව)**

**වේතන පරිමාණය.**—සාකච්ඡා කර වේතනය පිළිබඳ තීරණයකට එළඹිය හැකි වන අතර, එය මසකට සියලු දීමනා අඩංගුව රු. 1,200—6×50—රු. 1,500 අතර වනු ඇත.

**සුදුසුකම්.**—

(අ) ඉදි කිරීම් කටයුතු පිළිබඳ අඩු වශයෙන් අවුරුදු තුනක පළපුරුදුකම් ඇතිව වරලත් සිවිල් ඉංජිනේරුවෙකු වීම.

හෝ

(ආ) ඉදි කිරීමේ කටයුතු පිළිබඳ අඩු වශයෙන් අවුරුදු පහක පළපුරුදුකම් ඇතිව, බී. එස්. සී. ඉංජිනේරු උපාධිය තිබීම.

හෝ

(ඇ) කණිෂ්ඨ කාර්මික නිලධාරී සහතිකය හෝ ඒ හා සමාන සහතිකයක් සමග ඉදි කිරීම් කටයුතු පිළිබඳ අඩු වශයෙන් අවුරුදු 10 ක පළපුරුදුකම් තිබීම. මින් අඩු වශයෙන් අවුරුදු පහක් විධායක තනතුරක විය යුතුය.

විශ්‍රාම ලත් ඉංජිනේරුවන්ගේ පත්වීම් පාලනය කරනු ලබන රජයේ චක්‍ර ලේඛනවලට යටත්ව, විශ්‍රාම ලත් ඉංජිනේරුවන්ටද අයදුම් කළ හැක.

මෙම පත්වීම කරනු ලබන්නේ අවුරුදු තුනක කොන්ත්‍රාත්තුවක් මතය.

තෝරා ගනු ලබන අයදුම්කරු ව්‍යාපාරය ඇතුලත ගොඩනැගිලි සහ පාරවල සැලසුම් හා ඉදි කිරීම් සඳහා වගකිව යුතුය. ඉහත සඳහන් අංශයන්හි පළපුරුද්දක් තිබීමට අමතරව බඳවා ගැනීම්, කොන්ත්‍රාත්තු සහ පාලන ක්‍රම පිළිබඳව ඔහුට පළපුරුද්දක් තිබිය යුතුය. සංස්ථාව විසින් දක්වන ඉලක්කයන් සහ ඉදි කිරීම් උප ලේඛනයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් ද ඔහුට තිබිය යුතුය.

**(5) ක්‍රම සම්පාදන නිලධාරී/ව්‍යාපෘති නිලධාරී—IV වෙනි ශ්‍රේණිය**

**වේතන පරිමාණය.**—රු. 800—10×40—රු. 1,200 (සියලු දීමනා අඩංගු මාසික)

**සුදුසුකම්.**—

(අ) විධායක තනතුරක අඩු වශයෙන් අවුරුදු තුනක පළපුරුදුකම් ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු වීම

හෝ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන සහතිකයක් සමග ක්‍රම සම්පාදන සැලසුම් කිරීම් සහ ප්‍රගති පාලනය පිළිබඳව පිළිගත් කෘෂි කාර්මික හෝ කාර්මික ආයතනයක අඩු වශයෙන් අවුරුදු පහක පළපුරුදුකම් තිබීම.

අයදුම්කරුවන්ට සීනි කර්මාන්තයේ විවිධ අංශයන් පිළිබඳ මනා දැනුමක් තිබීම වඩා යෝග්‍ය වේ. උසස් අන්දමේ සංවිධානාත්මක

හැකියාව ඔවුන්ට තිබිය යුතු අතර, දැනට ඇති සහ යෝජිත සීනි කර්මාන්ත සඳහා සංවර්ධන සැලසුම් සහ ක්‍රියාත්මක සැලසුම් පිළියෙල කිරීමෙහි ලා පාලන පක්ෂයට උදව්දීමට ඔවුන්ට හැකි විය යුතුය. සංස්ථාවේ පස් අවුරුදු සැලැස්මට අනුකූලව මෙම සැලසුම් පිළියෙල කළ යුතු අතර, වර්ෂ හෝ මාස වැනි කාල ඒකක යන්, සීනි කර්මාන්ත වැනි ස්ථාන ඒකකයන්, ඉඩම් සැකසුම්, උක් වගාව, උක් කැපීම සහ ප්‍රවාහනය කිරීම, සීනි නිෂ්පාදනය කිරීම සහ සීනි වලින් අතුරු නිපයුම් නිෂ්පාදනය කිරීම වැනි කාර්ය ඒකකයන් වශයෙන් මෙම සැලසුම් බෙදා වෙන් කළ යුතුය. මෙවැනි සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මිනිසුන්, උප උපකරණ සහ මුදල් ප්‍රමාණය ගණන් බැලීම ඔහුගෙන් බලාපොරොත්තු වනු ලැබේ. මෙවැනි සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති වාර්තා පවත්වා ගන්නා අතර, ක්‍රියාත්මක කිරීමේ දී පැන නැගිය හැකි හෝ පැන නැගී ඇති ගැටළු සොයා ගෙන එවැනි ගැටළු නිරාකරණය කිරීම සඳහා කළ යුතු දේ නිර්දේශ කිරීම ඔහුගෙන් බලාපොරොත්තු වේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වන වේතන පරිමාණවල සුදුසු පියවරක තැබීම පිළිබඳව සලකා බලනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් කන්තලේ, හිඟුරාණ, උඩවලව හෝ වෙනත් ස්ථානයක පිහිටි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කිරීමටද සූදානම් විය යුතුය. ඔවුන් විසින් රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සිංහල භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් ද ලබා ගත යුතුය.

රජයේ හෝ රජයේ සංස්ථාවන්හි නිලධාරීන් දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් අයදුම් පත් එවිය යුතුය.

අයදුම් පත් ලියාපදිංචි තැපැලෙන්, සභාපති, ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයය, තැ. පෙ. 1486., 651, ඇල්විටිගල මාවත, කොළඹ 5 යන ලිපිනයට 1973 අගෝස්තු මස 25 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයය.

1973 ජූලි මස 31 වෙනි දින,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයය,
651, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 5.

8-499—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය.

---

### ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

**පර්යේෂණ සහකාරයින් (IV ශ්‍රේණිය).**

**අවශ්‍ය සුදුසුකම්.**—විෂයයක් වශයෙන් සංඛ්‍යා ලේඛනය සමග පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්. ඉංග්‍රීසි පිළිබඳ හොඳ දැනුමක් ඇති අපේක්ෂකයින්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස් සීමාව.**—ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනට වයස අවුරුදු 20ට වැඩි වියයුතු අතර, අවුරුදු 35ට අඩු විය යුතුය.

වැටුප් **පරිමාණය.**—රු. 305—8×15—10×25 රු. 675.

මාසික මූලික වැටුපක් සහ බැංකු පරිමාණයට අනුව දීමනා. රු. 575 ඉක්මවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වනු ඇත.

**සේවා කොන්දේසි :**

(i) තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගනු ලැබූ අපේක්ෂකයින් විසින් දළ වැටුපෙන් 6% ක් බැංකු අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතුය. බැංකුවේ දායක මුදල 9% වේ.

(ii) පත්වීම අවුරුදු තුනක පරිවාස කාලසීමාවකට යටත් වේ. රාජ්‍ය හෝ සංස්ථා සේවයේ සෑහෙන සේවා කාලයක් සහිත වූ අපේක්ෂකයකු තෝරාගනු ලැබේ නම්, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එබඳු අපේක්ෂකයකු කෙටි පරිවාස කාලයක් මත පත් කරනු ලැබීමට ඉඩ තිබේ.

(iii) සෑම අපේක්ෂකයකු විසින්ම ඔහු/ඇය—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා ශාරීරික සෞඛ්‍යයෙන් යුතු බව, සහ

(ආ) අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් ඇති අයකු බවට ප්‍රමාණවත් සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය.

(iv) තමාගේ නම සහ ලිපිනය ලියූ 8″×4″ ප්‍රමාණයට කුඩා නොවූ, මුද්දරයක් සහිත කවරයක් බැංකුවේ සේවක මණ්ඩල නිලධාරි වෙත එවීමෙන් ලබාගන්නා ෆෝර්ම මගින් අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය.

(v) අයදුම්පතක් හෝ අදාල ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(vi) තෝරාගනු ලැබූ අපේක්ෂකයන්—

(අ) දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීම සඳහා ඔවුන් ශාරීරික වශයෙන් සුදුසුද යන බව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

(ආ) අංක 33 හා 1956 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධිවිධානයන්ට සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීම සඳහා දැනට පනවා ඇති හෝ මින් ඉදිරියට පනවනු ලබන ඕනෑම නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුවේ.

(ඇ) බැංකුව විසින් නිගමනය කරනු ලබන ප්‍රමාණයට සහ ආකාරයට ඇප තැබිය යුතුවේ.

(ඈ) ශ්‍රී ලංකා ජනරජයට පක්ෂපාතිත්ව දිවුරුමක් හා රහස්‍යතා දිවුරුමක් අත්සන් තැබීම කළ යුතුවේ.

(vii) නියමිත පරිදි සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත් 1973 අගෝස්තු මස 31 වන දිනට පෙර ලැබෙන පරිදි, සේවක මණ්ඩල නිලධාරි, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, 'ඉතිරි කිරීමේ මන්දිරය', කොළඹ 3 වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සාමාන්‍යාධිකාරි,
ජාතික ඉතිරි කිරීමේ බැංකුව.

කොළඹ 3,
1973 ජූලි මස 31 දින,

8-509—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : සාප/3/434.

### අධ්‍යාපන අමාත්‍යාංශය

විද්‍යා විෂයයන් පිළිබඳ උපදේශක තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි විද්‍යා විෂයයන් පිළිබඳ උපදේශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කළයුතු අයදුම්පත්, 1973. 08. 27 දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ උඩ වම් කෙළවරේ "විද්‍යා විෂයයන් පිළිබඳ උපදේශක තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. පත්වීම අර්ථ සාධක අරමුදල් ක්‍රමය යටතේ වනු ඇත. පත් කරනු ලබන අය විසින් තමාගේ වැටුපෙන් සියයට 6 ක් අර්ථ සාධක අරමුදල සඳහා දායක මුදල් වශයෙන් ගෙවිය යුතු අතර, රජය විසින් සියයට 9 ක් ඒ සඳහා ගෙවනු ඇත. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු පරිවාස කාලසීමාවකට යටත්වේ. දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු තෝරාගනු ලැබුව හොත්, ඔහුගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා කෙරෙන අතර, ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වන්නේ ය.

3. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම, පහත දැක්වෙන සුදුසුකම් ලබා සිටින බවට පිළිබඳ හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1973.08.27 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හෝ 40 ට නොවැඩි බව, (දැනටමත් රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) පහත දැක්වෙන අධ්‍යාපන සුදුසුකම් ලබා සිටින බව :—

(අ) භෞතික විද්‍යාව සහ ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

**සටහන.**—ඉගැන්වීමේ පළපුරුද්දක් හා/හෝ ඉහත සඳහන් විෂයයන් සහිත රසායන විද්‍යාවත් ඇතුළු උපාධියක් තිබීම විශේෂ සුදුසුකම් වශයෙන් සලකනු ලැබේ.

(iv) විෂය පිළිබඳ සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති බව, (පහත 4 වැනි ඡේදයද බලන්න).

(v) සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් ඇති බව. නැතහොත්, පත්වීම ලැබී අවුරුදු 3 ක් ඇතුළත සිංහලෙන් ඉගැන්වීමට ප්‍රවීණත්වයක් ලබා ගැනීමට හැකියාව තිබෙන බව.

4. **වැටුප් ක්‍රමය.**— මෙම තනතුරට අයත් වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 6,024—4×144 සහ 8×180 රු. 8,040 වේ. අවුරුදු 5 කට අඩු පළපුරුද්දක් ඇති අයකු තෝරාගනු ලැබුවහොත් ඔහු විසින් අවශ්‍ය පළපුරුද්ද සම්පූර්ණ කරන තුරු රු. 6,024 ක නියමිත ඒකාබද්ධ වැටුපක් සහිතව වැඩ බැලීමේ පදනමක් මත පත් කරනු ලැබේ. රු. 6,780 සහ රු. 7,500 වාර්ෂික ඒකාබද්ධ වැටුප් පියවරවල් ඉක්මවා යාමට පෙර කාර්යක්ෂමතා කඩඉම් වලින් සමත් විය යුතුය. (1969.10.1 ට පෙර මීට අනුරූපව පැවති වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,420—120×4 සහ 180×8—රු. 5,340 විය.)

5. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත 1 ඡේදයේ සඳහන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියමිත දිනයට පෙර ලැබී ප්‍රමාදය පිළිබඳව සැලකිය හැකිය යුතු කරුණු ඔහු විසින් ඉදිරිපත් කළහොත් පමණක්, ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද, සෑම අයදුම්කරුවකු විසින්ම තම ඉල්ලුම්පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙළින්ම මේ අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පත් වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතික හෝ පාඨශාලාවන්ට ඇතුල්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතික භාරගනු නොලැබේ).

(ආ) අධ්‍යාපන සහතික.

(ඉ) වෘත්තීය/කාර්මික සහතික.

(ඊ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3 ක් (දැනට රජයේ ස්ථිර සේවයේ සිටින අයදුම්කරුවන් විසින් මෙ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

7. අයදුම්පත් හා ඊට අදාල වෙනත් ලිපි, මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ නිල ලිපිනයට හැර කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි කෙරෙහිද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ගෙවුණු කල, අයදුම්පත ලද බවට දැන්වීමක් නොලද හොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත වහාම දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාව පැහැර හැරියොත්, තම අයදුම්පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමි වනු ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 27 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ, සාමාන්‍ය පරිපාලන ශාඛාවේදීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

අඟල් 8½×13½ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය

**අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ආයතනයන්හි විද්‍යා විෂයයන් පිළිබඳ උපදේශක තනතුර**

1. නම (මුලකුරු සහිතව) :————.

2. සම්පූර්ණ නම :————.

3. රාජකාරි ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————

5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.

(ආ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද ? : ————.

6. උපන් දිනය :—අවුරුද්ද :——, මාසය :——, දිනය :————.

7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස :—

අවුරුදු :——, මාස :——, දින :————.

8. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :—

(අ) තනතුර :————.

(ආ) ස්ථිරද, තාවකාලිකද ? :————.

(ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :————.

(ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.

(උ) දෙපාර්තමේන්තුව :————.

(ඌ) ආයතනය/සේවා ස්ථානය :————.

(එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.

(ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————

9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :—

| විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

10. වෘත්තීය/කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :—

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන :—

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |

12. වෘත්තීය/කාර්මික අධ්‍යාපනය ලද ආයතන :—

| ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළිවෙලට සඳහන් කරන්න) :—

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර | ස්ථිරද, තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| | | | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේද ? (එසේ නම්, විස්තර දක්වන්න) :————.

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද ? (එසේ නම් විස්තර දක්වන්න) :————.

16. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම් ඔබේ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

17. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-390—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/92/31 (ජී)

**රජයේ ලඝු ලේඛක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

පහත නම් සඳහන් රජයේ ලඝු ලේඛක සේවයේ ඉහළ ශ්‍රේණියේ නිලධාරීන්, ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට ක්‍රියාත්මක වන පරිදි, රජයේ ලඝු ලේඛක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති තුමන් විසින් අනුමත කොට ඇති බව මෙයින් දන්වනු ලැබේ.

| | නම | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | දිනය |
|---|---|---|---|
| 1. | එම්. ඩී. ඩී. ආර්. ගුණතිලක මහතා ... | ... කෘෂිකර්ම ... ... | 1971.11.18 |
| 2. | වී. දේවදසන් මහතා ... | ... කම්කරු ... ... | 1972.09.14 |
| 3. | ආර්. එම්. ඩබ්ලිව්. පෙරේරා මහතා ... | ... දිස්ත්‍රික් උසාවිය, කොළඹ ... ... | 1973.01.31 |
| 4. | එස්. ප්‍රනාන්දු මහතා ... | ... වැටුප් හා සේවක සංඛ්‍යා කො. ... | 1973.02.25 |
| 5. | ජේ. එච්. එස්. එස්. ජයසුන්දර මහතා ... | ... මහේස්ත්‍රාත් උසාවිය, හෝමාගම ... | 1973.02.28 |
| 6. | එස්. එම්. ඩී. ජී. ජයකොඩි මිය. ... | ... දේශීය ආදායම් ... ... | 1973.04.01 |

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත්පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 31 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ, ඒකාබද්ධ සේවා අංශයේ දී ය.

8-496—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාදා | ... | 73.07.25 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාදා | ... | 73.08.01 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාදා | ... | 73.08.08 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාදා | ... | 73.08.15 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාදා | .. | 73.08.22 | බදාදා | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාදා | ... | 73.08.29 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාදා | ... | 73.09.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාදා | ... | 73.09.11 | අඟහරුවාදා | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාදා | ... | 73.09.19 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. සී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.